## දත්ත ආර්ථවතාවෙන් නිදහස් කර යෝග්‍ය තීරණ ගැනීම.

- ආර්ථව නැතහොත් සෘතුමය විචලන නිසා විචල්‍යයක් තාවකාලික වශයෙන් පමණක් උස් පහත් වීමට භාජනය වන හෙයින් ආර්ථව විචලන මත විචල්‍යයක හැසිරීම පුරෝකථනය කිරීම අපහසුය.
- ආර්ථව විචලන සහිත දත්ත මත කරනු ලබන පුරෝකථන පිළිබඳ විශ්වාසය තබා ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම අවදානම් සහිතය.
- පුරෝකථන කිරීමේදී කාලශ්‍රේණි දත්ත තුළ ඇති ආර්ථව චලන ඉවත් කර ගැනීමට අවශ්‍ය වේ.එය හඳුන්වනු ලබන්නේ කාලශ්‍රේණි දත්ත ආර්ථව චලනයන්ගෙන් නිදහස් කිරීම යනුවෙනි.
- ආර්ථව දර්ශක යොදා ගෙන කාලශ්‍රේණි දත්ත ආර්ථව චලනයන්ගෙන් නිදහස් කළ හැකිය.

1. පහත වගුව අධ්‍යයනය කරන්න.

<u>සෘතුමය වෙනස්වීම් මත අයිස්ක්‍රීම් අලෙවිය</u>

| අලෙවිය | තද වැසි සමය<br>දෙසැම්බර් මාර්තු | ග්‍රීස්ම සමය<br>ජූනි අගෝස්තු |
|---|---|---|
| සාමාන්‍ය මට්ටමින් | 60% ක් පහළ යයි. | 50% ක් ඉහළ යයි. |
| 2019 වර්ෂයේ අලෙවිය | 800kg | 1600kg |

2019 වසරේ අපේක්ෂිත කාලගුණික වෙනස්වීම් සිදු නොවූයේ නම් පහත දෑ ගණනය කරන්න.

1.දෙසැම්බර් - මාර්තු වකවානුවේ අයිස්ක්‍රීම් අලෙවිය කොපමණද?

2.ජූනි - අගෝස්තු වකවානුවේ අයිස්ක්‍රීම් අලෙවිය කොපමණද?